

කාර්ය සාධන වාර්තාව 2021
செயல் நிறைவேற்ற அறிக்கை 2021
Performance Report 2021

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

பின்தங்கிய கிராம பிரதேச அபிவிருத்தி, வீட்டு விலங்கின வளர்ப்பு மற்றும் சிறு பொருளாதாரப் பயிர்ச்செய்கை மேம்பாட்டு இராஜாங்க அமைச்சு

State Ministry of Backward Rural Areas Development and Promotion of Domestic Animal Husbandry & Minor Economic Crop Cultivation



කාර්ය සාධන වාර්තාව 2021

2020.10.06 දිනැති අංක **2196/27** දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, **2022.04.28** දිනැති අංක **2277/53** දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස සංශෝධනය කර ඇත. පසුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය ලෙස ක්‍රියාත්මක වේ. මෙම වාර්තාව මගින් පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ **2021** වර්ෂයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර ඇත. **(ශීර්ෂය 407)**

කෘෂිකර්ම අමාත්‍යාංශය - ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය
6 සහ 7 වන මහල, තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල
310, ඩී. ආර්. විජේවර්ධන මාවත
කොළඹ 10.

පටුන

පිටු අංකය

01. පරිච්ඡේදය - ආයතන පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම - 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු - 1 - 2

1.3 ප්‍රධාන කාර්යයන් - 2

1.4 සංවිධාන සටහන - 3

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන - 4 - 5

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම - 6 - 14

03. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය - 15 - 25

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක - 26

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය - 26 - 27

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ - 28

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව - 29 - 34

ඇමුණුම්

- ඇමුණුම් - **01** - 35
- ඇමුණුම් - **02** - 36
- ඇමුණුම් - **03** - 37 -39

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

01. පරිච්ඡේදය - ආයතන පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

2020.10.06 දින නිකුත්කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2196/27 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි අලුතින් ඇති කරන ලද පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සුවිශේෂී අරමුණු කිහිපයක් පෙරදැරිව ඉදිරි වසර කිහිපය ඇතුළත ඒ සඳහා විසඳුම් ලබා දීමේ අරමුණින් යුතුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත.

එමගින් දක්වා ඇති පරිදි, මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගැනෙන එකම ආයතනය "ශ්‍රී ලංකා හදබිම අධිකාරිය" වේ.

දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා	ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්
ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය	රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත **(1972 අංක 11)**

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

අමාත්‍යාංශය

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දැක්ම

ග්‍රාමීය අඩු පහසුකම් සහිත ජනතාවට දිවියට සවියක්

මෙහෙවර

නිසි කළමනාකාරිත්වයකින් හෙබි ජන දිවියක් නිර්මාණය කිරීමේ අරමුණ පෙරදැරිව, තනි හෝ ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් සහ යටිතල පහසුකම් සැපයීම තුළින්, පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් නව ජීවනෝපාය මාර්ග ඇතිකර, සමාජීය හා ආර්ථික වශයෙන් තනිව නැගීසිටීමට හැකිවන පරිදි සවිබල ගන්වා, දියුණුවේ මංපෙත් නිර්මාණය කර ගැනීම සඳහා දායකත්වය සැපයීම

අරමුණු

1. ස්වයං රැකියා මාර්ග ඇති කිරීම මගින් ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම
2. ග්‍රාමීය නිෂ්පාදන වර්ධනය තුළින් ජාතික නිෂ්පාදනයට දායකත්වය ලබා දීම
3. ග්‍රාමීය ජනතාවගේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම
4. සහස්‍ර සංවර්ධන ඉලක්ක හා රට හදන සෞභාග්‍යයේ දැක්මේ ඉලක්ක ළඟා කර ගැනීම
5. දේශීය සුළු ආර්ථික භෝග වගාව නගා සිටුවීම මගින් ආනයන නවතා විදේශ විනිමය ඉතිරි කර ගැනීම
6. දේශීය සුළු ආර්ථික භෝග ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන ඇති කිරීමට සහාය වීම හා අපනයනයට දිරි දීම
7. සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම මගින් නිරෝගීමත් ජනතාවක් ඇති කිරීමට පියවර ගැනීම

1.3. ප්‍රධාන කාර්යයන්

(1) සුවිශේෂිත භූගෝලීය ලක්ෂණයන් සහිත ප්‍රදේශයන්හි වගා කළ හැකි කහ, උඳු, ඉඟුරු, දේශීය අල වර්ග වැනි සුළු භෝග ගෘහ ආශ්‍රිත ඉඩම්වල වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(2) ගෘහ ආශ්‍රිතව එළුවන් හා කුකුළන් ඇති කිරීම සඳහා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති සේවාවන් ක්‍රමවත් ලෙස ලබා දීම.

(3) මූල්‍ය ආයතන, තාක්ෂණික සේවා ආයතන, මූලික උපකරණ හා අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් හඳුනා ගෙන එමගින් සුළු භෝග ආශ්‍රිත ගෘහ නිෂ්පාදන පුළුල් කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීම සම්බන්ධීකරණය කිරීම

(4) අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් උතුරු සහ නැගෙනහිර පළාත්වල පසුගාමී ගම්වල ජීවනෝපාය මාර්ග හා මූලික අවශ්‍යතා සවිබල ගැන්වීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ඇතුළත් පුනර්ජීවන මූල්‍ය පහසුකම් ක්‍රමවේදයක් හඳුන්වා දීම.

(5) ත්‍රස්තවාදී ක්‍රියාවන්ට ලක් වූ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග, වාරිමාර්ග, පානීය ජල පහසුකම්, විදුලිය, බෙහෙත් ශාලා හා ප්‍රාථමික පාසල් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වැඩසටහන් වලට ප්‍රමුඛත්වය ලබා දීම සඳහා දිළිඳු බව පිටු දැකීම හා ආර්ථික පුනර්ජීවනය සඳහා ක්‍රියාත්මක වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

1.4. සංවිධාන සටහන : පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය



1.5. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1.5.1. "ශ්‍රී ලංකා හදබිම අධිකාරිය" (ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය)

1972 අංක **11** දරණ කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත යටතේ **1978** වර්ෂයේ ස්ථාපිත කරන ලද ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය පසුකාලීනව ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය) බවට පරිවර්තනය විය.

2020.10.06 දින නිකුත්කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **2196**/ 27 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි අලුතින් පිහිටුවන ලද පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

ඒ අනුව මෙම ආයතනය වෙත පැවරුණු මූලික කාර්ය භාරය වනුයේ,

1. කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය, පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ අමාත්‍යවරයා විසින් කලින් කළ නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ එම සැලසුම් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාවේ යෙදවීම.
2. සංස්ථාව සතු කරන ලද හෝ පවරන ලද සියලු ඉඩම් , උපරිම එලදාව, පරිසරය රැකීම, ඉඩම් හා ජලසම්පත් සංරක්ෂණය හා ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම.
3. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම හා අලෙවි කිරීම.
4. කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධනය සඳහා පිරියත උපකරණ හා යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම හා ක්‍රියාත්මක කිරීම.
5. **1** වන ඡේදයේ නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ දියබෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන සියලු පියවර ක්‍රියාත්මක කිරීම.

ඉහත කරුණු වලට අදාළව මෙම ආයතනය ප්‍රධාන කාර්යයන් **11** ක් යටතේ ක්‍රියාත්මක වේ.

1. පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමනාකරණය
2. ගොවි පෝෂණ වැඩසටහන හෙවත් පශ්චාත් ගෘහස්ත කුකුල් පාලනය
3. පාංශු පෝෂණ වැඩසටහන
4. කිරි ගව පාලනය
5. වැසිදිය කළමනාකරණ වැඩසටහන
6. මී මැසි පාලනය
7. ගෙවතු වගාව
8. පාසල් පාරිසරික වැඩසටහන
9. ගොවි පුහුණු වැඩසටහන
10. දිය කඳුරු සංරක්ෂණය
11. කාබනික පොහොර වැඩසටහන

දැක්ම :

තිරසර ඉඩම් හා ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා වන සේවා විශිෂ්ටත්වයක් තුළ හරිත වූ පරිසරයක් සහ සරු ඵලින් සපිරි රටක්

මෙහෙවර :

ඵලදායි ඉඩම් කළමනාකරණය, විධිමත් ජල සංරක්ෂණයක් හා උසස් මානව සම්පත් උපයෝජනය තුළින් පාරිසරික සම්පත් සංරක්ෂණය හා කෘෂි ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම

මෙම ආයතනය පරිපාලන කටයුතු පහත අංශයන් යටතේ ක්‍රියාත්මක වේ.

- පාලන අංශය
- ව්‍යාපෘති හා සැලසුම් අංශය
- සංවර්ධන අංශය
- අලෙවි අංශය
- මූල්‍ය අංශය

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2021 වර්ෂය සඳහා අනුමත සංවර්ධන වැඩසටහන්

- පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධව නව රාජ්‍ය අමාත්‍යාංශයක් ලෙස **2020** වර්ෂයේ ඔක්තෝම්බර් මස **06** වන දින පිහිටුවන ලද අතර ඒ වන විට **2021** වසර සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කර අවසන් වී තිබූ බැවින් මෙම අමාත්‍යාංශයට අදාළ විෂයයන් යටතේ ප්‍රතිපාදන වෙන් වී නොතිබුණි.

- ඉන්දියානු රජයේ ප්‍රදානයන් යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභීන් සඳහා ජනීපාරක්ෂක ඒකක **3,400** ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අයවැය ඇස්තමේන්තු යටතේ **2021** වර්ෂයට විදේශීය අරමුදල් රු. මි. **100** ක් ද, දේශීය අරමුදල් රු. මි. **100** ක් ද වශයෙන් අනුමත වී ඇත.

- **2021** වර්ෂයට වෙනත් ප්‍රතිපාදන වෙන්වී නොතිබූ බැවින් අමාත්‍යාංශයේ විෂයය පථයට අදාළ විෂයයන් යටතේ පහත ව්‍යාපෘති යෝජනා සකස් කර අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

<u>භෝග වගා ව්‍යාපෘති</u>

ව්‍යාපෘතියේ නම	අපේක්ෂිත මුදල රු.මි.
1. දේශීය කහ නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන	**100.00**
2. දේශීය ඉඟුරු නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන	**100.00**
3. දේශීය මුං නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන	**30.00**
4. දේශීය උඳු නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන	**50.00**

<u>සත්ත්ව නිෂ්පාදන ව්‍යාපෘති</u>

ව්‍යාපෘතියේ නම	අපේක්ෂිත මුදල රු.මි.
5. එළුවන් ඇතිකිරීමේ වැඩසටහන	**100.00**

- මීට අමතරව භෝග වගා ව්‍යාපෘති සඳහා **2021** වර්ෂයට ප්‍රතිපාදන අනුමත කරගැනීම සඳහා වී හා ධාන්‍ය, ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත ද ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදී.

  ඒ අනුව ඉහත පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු **2021** වර්ෂයට මෙම අමාත්‍යාංශයට අනුමත වූ ප්‍රතිපාදන සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

  - ✓ වී හා ධාන්‍ය, ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMA/P/01/26/2021 දරණ 2021.03.26 දිනැති ලිපියෙන් භෝග වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු. මි. **50** ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
  - ✓ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RE/118/407/01/2020 දරණ **2021.03.29** දිනැති ලිපියෙන් භෝග වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු. මි. **100** ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
  - ✓ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RE/118/407/**05**/2021 දරණ **2021.06.11** දිනැති ලිපියෙන් එළුවන් ඇතිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රු. මි. **50** ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

  උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වසර **30** ක් පුරා යුද්මය වාතාවරණයකට මුහුණදීම හේතුවෙන් එම ප්‍රදේශවල ගැටළු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. යුද්මය තත්ත්වය හේතුවෙන් හැකියාව ඇති පිරිස් විදේශ රටවලට හා රටේ වෙනත් ප්‍රදේශවලට ජීවිතාරක්ෂාව පතා සංක්‍රමණය වූ අතර එසේ යා නොහැකිවූ පිරිස් යුද්ධයේ පීඩනය දරාගනිමින් අසරණව ජීවිකාව ගෙවා ඇත. එබැවින් විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය ඉලක්ක කර පිහිටුවා ඇති මෙම අමාත්‍යාංශය ඒ සඳහා විශේෂ අවධානයක් යොමුකර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, මෙම අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා භදබිම අධිකාරියේ **2021.01.01** දින සිට **2021.12.31** දක්වා ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මෙම වාර්තාවේ ඇතුළත් කර ඇත.

2.2. පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - 2021.01.01 සිට 2021.12.31 දක්වා ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

i. උඳු සහ මුං භෝග වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(වී හා ධාන්‍ය, ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ඵෑණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයෙන් වෙන් කළ රු. මී. 50.00 ප්‍රතිපාදන යටතේ උතුරු, නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කෙරිණ.)

දිස්ත්‍රික් ලේකම්ගේ බලධාරිත්වය යටතේ දිස්ත්‍රික් කෘෂිකර්ම නිලධාරීන් සහ ප්‍රාදේශීය කෘෂිකර්ම නිලධාරීන් මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. එක් එක් දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබූ ආකාරය සහ ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත දැක්වේ. ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල රු.මී. **49.271** කි. ප්‍රතිලාභීන් **8,568** ක් සඳහා බෙදා දුන් බීජ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් **57,553** ක් වන අතර වගා කළ මුළු බිම් ප්‍රමාණය අක්කර **4,798** කි.

- උඳු සහ මුං භෝග වගා ව්‍යාපෘතිය - ප්‍රගතිය **2021.12.31** දිනට

දිස්ත්‍රික්කය	භෝගය	වෙන් කළ ප්‍රතිපාදන රු.මී.	ප්‍රතිලාභීන් ගණන	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වගා කළ භූමි ප්‍රමාණය (අක්කර)	වැය කළ මුදල රු.මී (බීජ)	පරිපාලන වියදම් රු.මී.	මුළු වියදම	අපේක්ෂිත අස්වැන්න (කි.ග්‍රෑ.)
අම්පාර	මුං	3.00	311	3,732	311	2.8736	0.0974	4.9659	93,300
	උඳු	2.00	181	2,145	179	1.9948			53,625
	එකතුව	5.00	492	5,877	490	4.8684	0.0974	4.9659	
මඩකලපුව	මුං	11.00	1,966	13,560	1,130	10.7319	0.4085	20.8348	339,000
	උඳු	10.00	1,435	10,749	896	9.6944			266,400
	එකතුව	21.00	3401	24,309	2,026	20.4263	0.4085	20.8348	
ත්‍රිකුණාමලය	මුං	3.00	626	3,735	311	2.8760	0.0957	4.8829	140,17 5
	උඳු	2.00	404	2,055	172	1.9112			48,020
	එකතුව	5.00	1,030	5,790	482	4.7872	0.0957	4.8829	
වවුනියාව	මුං	2.00	325	2,181	182	1.7666	0.0735	3.7482	72,700
	උඳු	2.00	441	2,152	179	1.9081			80,663
	එකතුව	4.00	766	4 ,333	361	3.6747	0.0735	3.7482	
මන්නාරම	මුං	2.00	199	2,376	198	1.9246	0.0589	2.9104	59,400
	උඳු	1.00	86	1,032	86	0.9288			25,800
	එකතුව	3.00	285	3,408	284	2.8534	0.0589	2.9104	
කිලිනොච්චි	මුං	2.00	455	2,469	206	1.9999	0.0782	3.9894	67,320
	උඳු	2.00	428	2,125	179	1.9114			64,410
	එකතුව	4.00	883	4,594	386	3.9113	0.0782	3.9894	
මුලතිව්	මුං	2.00	374	2,469	205	1.9999	0.0782	3.9894	61,575
	උඳු	2.00	321	2,152	179	1.9114			53,805
	එකතුව	4.00	695	4,621	382	3.9113	0.0782	3.9894	
යාපනය	මුං	2.00	478	2,469	206	1.9999	0.0774	3.9895	74,700
	උඳු	2.00	538	2,152	179	1.8722			86,000
	එකතුව	4.00	1,016	4,621	386	3.8721	0.0774	3.9895	
මුළු එකතුව	මුං	27.00	4,734	32,991	2,749	26.1724			908,170
	උඳු	23.00	3,834	24,562	2,049	22.1323			678,723
		50.00	8,568	57,553	4,798	48.3047	0.9660	49.2707	1,586,893

ii. උඳු, මුං සහ ඉඟුරු භෝග වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් වෙන් කළ රු. මී. 100.00 ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කෙරිණ.)

දිස්ත්‍රික් ලේකම්ගේ බලධාරීත්වය යටතේ දිස්ත්‍රික් කෘෂිකර්ම නිලධාරීන් සහ ප්‍රාදේශීය කෘෂිකර්ම නිලධාරීන් මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. එක් එක් දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය සහ ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත දැක්වේ. ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල රු.මී. 89.264 කි. දිස්ත්‍රික් 17 ක ප්‍රතිලාභීන් 15,881 ක් සඳහා බෙදා දුන් බීජ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 120,672 ක් වන අතර වගා කළ මුළු බිම් ප්‍රමාණය අක්කර 6,474 කි.

➢ උඳු, මුං සහ ඉඟුරු භෝග වගා ව්‍යාපෘතිය - ප්‍රගතිය 2021.12.31 දිනට

#	දිස්ත්‍රික්කය	භෝගය	වෙන් කළ ප්‍රතිපාදන (රු.මී.)	සංශෝධිත ප්‍රතිපාදන (රු.මී.)	ප්‍රතිලාභීන් ගණන	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වගා කළ ඉඩම් ප්‍රමාණය (අක්කර)	වැය කළ මුදල - බීජ සඳහා (රු.මී.)	පරිපාලන වියදම (රු.මී.)	මුළු වියදම (රු.මී.)	අපේක්ෂිත අස්වැන්න
1.	මඩකලපුව	ඉඟුරු	15.0000	15.0000	1,859	24,010	52	14.4060	0.2422	14.6482	144,060
		උඳු	5.0000	5.0000	760	3,000	445	4.8879	0.0975	4.9854	133,425
		මුං	5.0000	5.0000	830	6,048	504	4.8989	0.0968	4.9957	151,200
		එකතුව	**25.0000**	**25.0000**	**3,449**	**33,058**	**1,001**	**24.1928**	**0.4365**	**24.6293**	**428,685**
2.	අම්පාර	ඉඟුරු	2.0000	-	-	-	-	-	-	-	-
		උඳු	2.0000	6.8703	603	7,236	603	6.7295	0.1171	6.8466	53,625
		මුං	2.0000	6.3511	640	7,680	640	6.2208	0.1244	6.3452	93,300
		එකතුව	**6.0000**	**13.2214**	**1,243**	**14,916**	**1,243**	**12.9503**	**0.2415**	**13.1918**	**146,925**
3.	ත්‍රිකුණාමලය	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	2.5000	514	2,640	220	2.4548	0.0758	3.9967	
		මුං	1.5000	1.5000	283	1,810	151	1.4661			
		එකතුව	**4.0000**	**4.0000**	**797**	**4,450**	**371**	**3.9209**	**0.0758**	**3.9967**	
4.	අනුරාධපුරය	ඉඟුරු	1.0000	1.0000	-	-	-	-	-	-	
		උඳු	1.5000	3.5000	456	3,070	255	2.8553	0.0733	4.0087	85,295
		මුං	1.5000	1.5000	223	1,334	111	1.0801			66,675
		එකතුව	**4.0000**	**6.0000**	**679**	**4,404**	**366**	**3.9354**	**0.0733**	**4.0087**	**151,970**
5.	පොළොන්නරුව	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	4.0000	463	3,450	287	3.2085	0.0351	3.2436	
		මුං	1.5000	-	-	-	-	-	-	-	
		එකතුව	**4.0000**	**4.0000**	**463**	**3,450**	**287**	**3.2085**	**0.0351**	**3.2436**	
6.	කුරුණෑගල	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.0000	1.3660	450	1,440	180	1.3392	0.0233	1.3625	108,000
		මුං	1.0000	1.6326	830	1,976	247	1.6006	0.0274	1.6280	148,200
		එකතුව	**3.0000**	**2.9986**	**1,280**	**3,416**	**427**	**2.9398**	**0.0507**	**2.9905**	**256,200**
7.	පුත්තලම	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	2.5000	299	1,605	136	1.4948	0.0597	3.0423	50,996
		මුං	1.5000	1.5000	395	1,834	152	1.4878			57,277
		එකතුව	**4.0000**	**4.0000**	**694**	**3,439**	**288**	**2.9826**	**0.0597**	**3.0423**	**108,273**
8.	යාපනය	ඉඟුරු	1.0000	1.0000	111	2,674	7	0.9795	0.0200	0.9995	
		උඳු	1.5000	3.0000	903	3,118	260	2.9393	0.0588	2.9981	124,720
		මුං	1.5000	-	-	-	-	-	-	-	
		එකතුව	**4.0000**	**4.0000**	**1,014**	**5,792**	**267**	**3.9188**	**0.0788**	**3.9976**	**124,720**
9.	වවුනියාව	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	7.9368	1,638	8,364	697	7.7785	0.1480	7.9265	313,650
		මුං	1.5000	0.0632	11	78	6	0.0632	0.0013	0.0645	2,600
		එකතුව	**4.0000**	**8.0000**	**1,649**	**8,442**	**703**	**7.8417**	**0.1493**	**7.9910**	**316,250**
10.	මුලතිව්	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	1.5000	201	1,476	123	1.2841	0.0693	3.4991	
		මුං	1.5000	2.0000	475	2,649	221	2.1457			
		එකතුව	**4.0000**	**3.5000**	**676**	**4,125**	**344**	**3.4298**	0.0693	**3.4991**	

(ඉතිරිය අ.පි.ඛ.)

➢ **උඳු, මුං සහ ඉඟුරු භෝග වගා ව්‍යාපෘතිය - ප්‍රගතිය 2021.12.31 දිනට (පසු පිටෙහි ඉතිරිය)**

11..	කිලිනොච්චි	ඉඟුරු	1.0000	0.9988	141	1,456	3	0.6552	0.0536	3.6512	12,850
		උඳු	1.5000	2.4088	411	2,916	243	2.3616			88,820
		මුං	1.5000	0.5924	94	717	60	0.5808			18,970
		එකතුව	**4.0000**	**4.0000**	**646**	**5,089**	**306**	**3.5976**	**0.0536**	**3.6512**	**120,640**
12.	මන්නාරම	ඉඟුරු	-	-	-	-	-	-	-	-	
		උඳු	-	2.0000	177	2,100	175	1.9530	0.0391	1.9921	
		මුං	-	2.0000	208	2,340	195	1.8954	0.0379	1.9333	
		එකතුව	**-**	**4.0000**	**385**	**4,440**	**370**	**3.8484**	**0.0770**	**3.9254**	
13.	හම්බන්තොට	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.0000	0.4610	44	486	41	0.4520	0.0082	0.4602	
		මුං	1.0000	-	-	-	-	-	-	-	
		එකතුව	**3.0000**	**0.4610**	**44**	**486**	**41**	**0.4520**	**0.0082**	**0.4602**	
14.	බදුල්ල	ඉඟුරු	1.0000	2.3892	229	5,895	13	1.3305	-	1.3305	58,900
		උඳු	1.0000	0.3054	-	-	-	-	-	-	
		මුං	1.0000	0.3054	-	-	-	-	-	-	
		එකතුව	**3.0000**	**3.0000**	**229**	**5,895**	**13**	**1.3305**	**-**	**1.3305**	**58,900**
15.	මොනරාගල	ඉඟුරු	1.0000	1.0000	89	2,500	6	1.1875	0.0879	3.9171	46,280
		උඳු	1.5000	1.5000	126	1,325	126	1.2323			172,800
		මුං	1.5000	1.5000	144	1,740	144	1.4094			118,440
		එකතුව	**4.0000**	**4.0000**	**359**	**5,565**	**276**	**3.8292**	**0.0879**	**3.9171**	**337,520**
16.	මහනුවර	ඉඟුරු	2.0000	3.0000	1,000	8,272	19	2.9400	0.0617	3.5577	
		උඳු	1.0000	-	-	-	-	-			
		මුං	1.0000	1.0000	293	1,112	142	0.5560			
		එකතුව	**4.0000**	**4.0000**	**1,293**	**9,384**	**161**	**3.4960**	0.0617	**3.5577**	
17.	නුවරඑළිය	ඉඟුරු	1.0000	2.0000	981	4,321	10	1.8148	0.0171	1.8320	43,210
		උඳු	1.0000	-	-	-	-	-	-	-	
		මුං	1.0000	-	-	-	-	-	-	-	
		එකතුව	**3.0000**	**2.0000**	**981**	**4,321**	**10**	**1.8148**	**0.0171**	**1.8320**	**43,210**
18.	කළුතර*	ඉඟුරු	2.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	-	-	-	-	-	-	-	
		මුං	1.5000	-	-	-	-	-	-	-	
		එකතුව	**5.0000**	-	-	-	-	-	-	-	
19.	කෑගල්ල*	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	-	-	-	-	-	-	-	
		මුං	1.5000	-	-	-	-	-	-	-	
		එකතුව	**4.0000**	-	-	-	-	-	-	-	
20.	ගාල්ල*	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	-	-	-	-	-	-	-	
		මුං	1.5000	-	-	-	-	-	-	-	
		එකතුව	**4.0000**	-	-	-	-	-	-	-	
21.	මාතර*	ඉඟුරු	1.0000	-	-	-	-	-	-	-	
		උඳු	1.5000	-	-	-	-	-	-	-	
		මුං	1.5000	-	-	-	-	-	-	-	
		එකතුව	**4.0000**	-	-	-	-	-	-	-	
	ඉතිරි ප්‍රතිපාදන			**3.8176**							
		ඉඟුරු	37.0000	26.3879	4,410	49,128	110	23.3135	1.5755	89.2646	305,300
		උඳු	31.5000	44.8484	7,045	42,226	3,791	40.9708			1,131,331
		මුං	31.5000	24.9446	4,426	29,318	2,573	23.4048			656,662
		එකතුව	100.0000	99.9985	15,881	120,672	6,474	87.6891	1.5755	89.2646	2,093,293

*මෙම දිස්ත්‍රික්කවල අදාළ භෝග වගා ක්‍රියාත්මක කිරීමට අනුමත කරන ලද කාල සීමාවන්හි දී අපහසු බව දන්වා ඇති බැවින් ප්‍රතිපාදන වෙනත් දිස්ත්‍රික්කවලට මාරු කරන ලදී.

- ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු. මී. **89.26** කි. **2021.12.31** ට ගෙවන ලද මුදල රු. මී. **64.7** ක් සහ ගෙවීමට ඇති අතැති බිල්පත් වටිනාකම රු.මී. **24.56** කි.

iii. **එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

(ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් වෙන් කළ රු. මී. 50.00 ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කෙරිණ.)

දිස්ත්‍රික් ලේකම්ගේ බලධාරීත්වය යටතේ දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරීන් සහ ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරීන් මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. එක් එක් දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිපාදන වෙන් කළ ආකාරය සහ ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත දැක්වේ. ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල රු.මී. 40.143 කි. දිස්ත්‍රික්ක 09 ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර ප්‍රතිලාභීන් 1,356 ක් සඳහා එළුවන් 2,729 ක් බෙදා දෙන ලදී.

- **එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය - ප්‍රගතිය 2021.12.31 දිනට**

දිස්ත්‍රික්කය	වෙන් කළ ප්‍රතිපාදනය රු.මී.	ප්‍රතිලාභීන් ගණන	බෙදාදුන් එළුවන් ගණන	මිලදී ගැනීමේ වියදම රු.මී.	පරිපාලන වියදම් රු.මී.	වැය කළ මුදල රු.මී
අම්පාර	5.00	154	308	4.5521	0.0142	4.5663
මඩකලපුව	20.00	662	1,351	19.4548	0.4090	19.8638
ත්‍රිකුණාමලය	5.00	175	350	4.6382	0.3601	4.9983
පොළොන්නරුව	5.00	164	328	4.9155	0.0516	4.967**1**
ගම්පහ	10.00	114	228	3.4200	0.0249	3.4449
බදුල්ල	1.00	18	36	0.5363	-	0.5363
කෑගල්ල	1.00	24	48	0.7200	0.0176	0.7376
මහනුවර	1.00	32	54	0.8994	-	0.8994
නුවරඑළිය	2.00	13	26	0.3900	0.0100	0.4000
එකතුව	**50.00**	**1,356**	**2729**	**39.5263**	**0.8874**	**40.4137**

- **ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු. මී. 40.41කි. 2021.12.31 ට ගෙවන ලද මුදල රු. මී. 36.72 ක් සහ ගෙවීමට ඇති අතැති බිල්පත් වටිනාකම රු.මී. 3.69 කි.**

iv මඩකලපුව දිස්ත්‍රික්කයේ මහජන සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා ඉන්දියානු රජයේ ප්‍රදානයන් යටතේ සනීපාරක්ෂක ඒකක 3,400 ක් ඉදිකිරීම

ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු රජය අතර මිත්‍රත්වය අවධාරණය කිරීම මෙන්ම දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා වල අනාගත සංවර්ධනයට දායකවීමේ අරමුණු පෙරදැරි කරගෙන, ඉන්දියානු රජය විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සහ සෞඛ්‍යය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය සහාය ලබාදීම සිදුකරනු ලබයි.

ඒ අනුව 2018.05.01 දිනැති අමාත්‍ය මණ්ඩල සංශෝධනයට පෙර පිහිටුවා තිබූ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් සිදු කරන ලද විශේෂ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, මඩකලපුව දිස්ත්‍රික්කයේ මහජන සෞඛ්‍යය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් ආවරණය වන පරිදි සනීපාරක්ෂක ඒකක 3,400 ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 300 ක මූල්‍ය ප්‍රදානයක් ලබාදීමට ඉන්දියානු රජය විසින් එකඟතාවය පළ කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රධාන වශයෙන් හඳුනාගත් පවුල් ඒකක 3,400 ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් අහිතකර සෞඛ්‍යය ගැටළු සහ දරිද්‍රතා මට්ටම අවම කිරීම සඳහා සහාය වීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇත.

ව්‍යාපෘතිය සඳහා වන එකතු කළ අගය මත බදු (VAT), රේගු බදු, වරාය සහ ආනයන බදු යනාදිය සහ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහිලා බැඳුනු අනෙකුත් මූල්‍ය බදු ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතු වන අතර ප්‍රසම්පාදනය සඳහා වූ සියලුම වියදම් ද, සේවා සැපයීම සහ අනුමත ව්‍යාපෘති යෝජනාව ඉක්මවන අතිරේක යටිතල පහසුකම් සැපයීම ද ශ්‍රී ලංකා රජයේ වගකීම වේ.

මෙම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය සංක්ෂිප්තව පහතින් දැක්වේ.

- **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018.07.03 දින ලබා දී ඇත. ශ්‍රී ලංකාව සහ ඉන්දීය රජය අතර අවබෝධතා ගිවිසුමක් 2018.07.19 දින අත්සන් කරන ලදී.**

- **ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා ආයතනයක් (Project Consultancy Service Institution) තෝරා පත් කරගෙන ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුවක්ද පත් කර ඇත.**

- **2020.10.06 දින මෙම අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට මෙම ව්‍යාපෘතිය ඇතුළත් කර ඇත.**

- **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් හා මාර්ගෝපදේශ ඇතුළත් අංක 2020/02 දරණ 2020.12.21 දිනැති චක්‍රලේඛය මඩකලපුව දිස්ත්‍රික් ලේකම් හා එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් 14 වෙත නිකුත් කරන ලදී.**

- **ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු ආයතන තෝරා ගැනීමට මිල ගණන් කැඳවීමෙන් අනතුරුව, තාක්ෂණික යෝජනා ඇගයීම් කටයුතු අවසන් කර ඇත. 2020.12.31 දින මූල්‍ය යෝජනා විවෘත කර ඇති අතර ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. මුල් ඇස්තමේන්තු වල මිල ගණන් වලට අනුව වර්තමාණයේ පවතින මිල ගණන් හා කටයුතු කළ නොහැකි බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි විය.**

- **ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා සකස් කර තිබූ අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීමට 2021.04.27 දිනැතිව සකස් කළ කෙටුම්පත මෙම අමාත්‍යාංශය වෙත 2021.04.30 දිනැති ලිපියෙන් එවා ඇත. ව්‍යාපෘතියේ වසර 03 ක ගිවිසුම් කාලය 2021.07.18 දිනෙන් අවසන් වන බැවින් ගිවිසුම සංශෝධනය කිරීමට යෝජිතය.**

- **සනීපාරක්ෂක ඒකකයක් වෙනුවෙන් සකස් කර ඇති ඇස්තමේන්තු පරිදි, වර්තමාන මිල ගණන් අනුව ඉදිකිරීම් කටයුතු කිරීමට නොහැකි බැවින් නැවත ඇස්තමේන්තු සකස් කර ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙසත් සනීපාරක්ෂක ඒකක 3,200ක් සඳහා ප්‍රතිලාභී ලේඛන සංශෝධනය කරන ලෙසත් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් 2021.12.08 දිනැති ලිපියෙන් දන්වා ඇත. ගිවිසුම සංශෝධනය කිරීමමෙන් පසු කටයුතු කිරීමට නියමිතය.**

v. "ගම සමග පිළිසඳරක් වැඩසටහන" සඳහා රාජ්‍ය අමාත්‍යාංශයේ දායකත්වය ලබාදීම

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන "ගම සමග පිළිසඳරක් වැඩසටහන" යටතේ තෝරාගත් ගම් ප්‍රදේශ පවතී නම්, මෙම අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී එම ගම් ප්‍රදේශ වලට ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන ලෙස අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරමින් අවශ්‍ය කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා භදබිම අධිකාරිය - 2021.01.01 සිට 2021.12.31 දක්වා ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

2021 වර්ෂයට මෙම ආයතනයේ සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල රු. මී. 100 කි. මෙම මුදල් යොදවා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය පහතින් දැක්වේ.

2021.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - ශ්‍රී ලංකා භදබිම අධිකාරිය

	විෂය පථය	ක්‍රියාකාරකම		වෙන් කළ මුදල රු.	2021.12.31 දිනට ප්‍රගතිය	
					මූල්‍ය රු.	භෞතික
1.	ඉඩම් ඵලදායීතාවය උපරිම මට්ටමකට ගෙන ඒම	1.	පාංශු සංරක්ෂණ ව්‍යූහ ස්ථාපිත කිරීම - 2020	8,150,200	8,146,200	2020 වර්ෂයේ පාංශු සංරක්ෂණ කටයුතු නිම කළ හෙක්ටයාර ප්‍රමාණය 814.62කි.
			පාංශු සංරක්ෂණ ව්‍යූහ ස්ථාපිත කිරීම - 2021	23,700,000	23,698,846	2021 වසරේ හෙක්ටයාර 1112.77ක් සංවර්ධනය කළ අතර හෙක්ටයාර 948 කට මුදල් ගෙවා ඇති අතර තවත් 164.77 කට ගෙවීමට ඇත.
		1.	කාබනික පොහොර නිෂ්පාදනය- 2020	10,441,944	10,441,944	2020 වර්ෂයේ අවිච්ඡේද වියදම් යටතේ ගොවීන් 2.584 ක් සඳහා අවශ්‍ය උපකරණ කට්ටල ලබාදීම.
			කාබනික පොහොර නිෂ්පාදනය- 2021	32,084,168	32,084,168	මහනුවර, මඩකලපුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ගොවීන් 1,700, 6,303 සහ 93 ක් සඳහා කෘෂි උපකරණ රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් මිළදී ගැනීමට කටයුතු සිදු කර ඇත. තවත් ගොවීන් 651 ක් සඳහා උපකරණ ලබා දීමට ඇත.
		1.	තාක්ෂණික පුහුණුව	160,723	160,714	ගොවීන් 4,291 ක් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
2	පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය	2.	ජල මූලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණය කිරීම	4,267,000	4,251,778	ජල මූලාශ්‍ර 18 ක් සංරක්ෂණය කර ඇත. (විස්තර පහත වගුවෙහි දක්වා ඇත.)
3	කෘෂි නිෂ්පාදන හා අලෙවිකරණ වැඩසටහන	3.	ගොවිපල සංවර්ධනය පල්ලෙකැලේ	252,000	251,335	ජල පොම්පයක් මිල දී ගැනීම.
		3.	ගොවිපල සංවර්ධනය කොත්මලේ	470,000	469,975	සිවිරෝද ට්‍රැක්ටරය සඳහා තට්ටුවක් (trailor) මිලදී ගැනීම.
		3.	බහුවිධ ආදායම් උත්පාදන වැඩසටහන - 01	8,463,500	8,463,328	මල් පැල තවාන්/මල් පෝච්චි අච්චු සැකසීම/ එළවළු පැල තවාන්/බීම්මල් වැඩසටහන හා කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඉල්ලුම් කර ඇති කෘෂි උපකරණ නිකුත් කර ඇත.
		3.	බහුවිධ ආදායම් උත්පාදන වැඩසටහන - 02 අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලනය ප්‍රවලිත කිරීමේ වැඩසටහන	6,847,500	6,847,500	මහනුවර දිස්ත්‍රික්කයේ ගොවි පවුල් 1,826 ක් සඳහා කුකුල් පැටවුන් 18,260 ක් ලබා දී ඇත.
	උප එකතුව			94,837,035	94,815,788	

2021.12.31 දිනට සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

	විෂය පථය	ක්‍රියාකාරකම		වෙන් කළ මුදල රු.	2021.12.31 දිනට ප්‍රගතිය	
					මූල්‍ය රු.	භෞතික
4.	ප්‍රජා සුභසාධන හා ආයතන කටයුතු	**4.**	විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	**535,000**	**533,930**	කඳුරට ගුවන්විදුලි සේවයේ "හදබිම ගැමී සරණිය සජීවී ගුවන්විදුලි වැඩසටහන් **10** ක් සහ "හදබිමෙන් ගොවිබිමට" ගුවන්විදුලි වැඩසටහන් **20** ක් විකාශය කර ඇත.
		4.	මාසික ප්‍රගති සමාලෝචන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	**183,800**	**183,800**	ප්‍රගති සමාලෝචන රැස්වීම් **07**ක් පවත්වා ඇත.
		4.	භෞතික සම්පත් සංවර්ධනය	**4,405,930**	**4,399,040**	කාර්යාලයට අවශ්‍ය භෞතික සම්පත් මිලදි ගැනීමට වැය කර ඇත.
		4.	ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු	**38,235**	**35,315**	ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සඳහා වැය කර ඇත.
	උප එකතුව			**5,162,965**	**5,152,085**	
	එකතුව			**100,000,000**	**99,967,873**	

2021 සංවර්ධන වැඩසටහන්වලට අදාළ ජල මූලාශ්‍ර - ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

දිස්ත්‍රික්කය		ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම	ජල මූලාශ්‍රයේ නම
මහනුවර	**1.**	පස්බාගේ කෝරළේ	දඩුබැදිරුප්ප	සෝලකන්ද නව ගම්මානය
	2.	ගඟ ඉහල කෝරළේ කෝරළේ	පැල්ලපිටිය උතුර	ලෙච්චම් පිහිල්ල
	3.	උඩපළාත	දුනුකේඋල්ල	බෝමන් ජනපද උල්පත
	4.	දොළුව	පුපුරුස්ස	යැරෝ හදබිම වැව උල්පත
	5.	දෙල්තොට	පේරවත්ත නැගෙනහිර	හපුවැල්මාන ඇළේ පන්සල අසල දිය පිහිල්ල
	6.	පාතහේවාහැට	ශ්‍රියාගම	අම්බලමාන ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය
	7.	හාරිස්පත්තුව	සීවලීකන්ද	කැටපොත පිහිල්ල
	8.	ගලගෙදර	පල්ලේකොටුව	වලවේ කුඹුර යායේ පිහිල්ල
	9.	පූජාපිටිය	දොලපිහිල්ල දකුණ	ඊරියගහදෙනිය පිහිල්ල
	10.	උඩුනුවර	හඳුනාගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.	
	11.	යටිනුවර	මොරගොල්ල	මොරගහඇලේ දිය පිල්ල රක්ෂිතය
	12.	හතරලියද්ද	වල්පලාගොල්ල	බෝලගල ළිඳ සංරක්ෂණය
	13.	පාතදුම්බර	ගුණැම්බිල්ල	නල්ලතන්නිය ජල මූලාශ්‍රය
	14.	පන්විල	මඩොල්කැලේ	අංක 9 පිහිටි ජල මූලාශ්‍රය
	15.	කුණ්ඩසාලේ	හීපිටිය	මහීපිටිය පිල්ල කුඹුර ජල මූලාශ්‍රය
	16.	මැදදුම්බර	දකුණු දොර ලියද්ද	හීල්ල ජල මූලාශ්‍රය
	17.	උඩුදුම්බර	පෝප්පිටිය	පෝප්පිටිය ජල මූලාශ්‍රය
	18.	මිනිපේ	වැල්ලගහවාඩිය	බටහිර වරාගොල්ල ජල රක්ෂිතය

ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ආවරණය වන සෞභාග්‍යය දැක්ම ප්‍රතිපත්තියේ අරමුණු පහතින් දැක්වේ.

- වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං හා කව්පි, ලූණු සහ අල වැනි භෝග නිෂ්පාදනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර එම භාණ්ඩ ආනයනය කිරීම සඳහා වැයවන ඩොං. මී. 500 කට අධික විදේශ විනිමය එම භෝග වවන ගොවීන්ගේ ආදායම බවට පත් කිරීමට කටයුතු කිරීම
- උතුරු ප්‍රදේශවල ගොවීන් නිෂ්පාදනය සඳහා දිරි ගන්වා දැනට ආනයනය සඳහා වැයවන ඇ.ඩොං. බිලියනයකට අධික විදේශ විනිමය ගොවියාගේ ආදායමක් බවට පත් කිරීමට කටයුතු කිරීම
- දේශීයව නිෂ්පාදනය කළ හැකි කෘෂි නිෂ්පාදන ආනයනය උපරිම වශයෙන් සීමා කිරීම.
- වසර 2025 වන විට එම නිෂ්පාදනවලින් රට ස්වයංපෝෂිත කිරීම.
- දේශීයව නිෂ්පාදනය කරන භෝග ආනයනය හා ප්‍රති අපනයනය නතර කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදනය දිරි ගැන්වීමෙන් දේශීය නිපැයුම් වැඩි කිරීමට කටයුතු කිරීම
- තිරසර පරිසර ප්‍රතිපත්තියක් යටතේ සෝදාපාළුව, නායයෑම් සහ පස වියලීම වැලැක්වීමට කටයුතු කිරීම හා එම බිම් හා අතහැර දමා ඇති භූමි කෘෂි වගාවට යොමු කිරීම
- ජනතා කේන්ද්‍රීය ආර්ථිකය යටතේ කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවලිත කිරීම සහ වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම, පාරම්පරික කෘෂි ගම්මාන කාබනික කෘෂි භෝග නිෂ්පාදනයට යොමු කිරීම
- ජනතා කේන්ද්‍රීය ආර්ථිකය යටතේ ඌන සංවර්ධිත ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම
- තිරසර පරිසර ප්‍රතිපත්තියක් යටතේ භූමි පරිභෝජන ප්‍රතිපත්තිය හා ජල කළමනාකරණ ප්‍රතිපත්තිය තිරසරභාවය සහතික කිරීම සහ වන වගාවන් නැවත සිදු කිරීම, ස්වභාවික පරිසර පද්ධති සංරක්ෂණය
- තිරසර පරිසර ප්‍රතිපත්තියක් යටතේ පාරිසරික අධ්‍යනය වන සංරක්ෂණය , ජල සංරක්ෂණය හා පාංශු සංරක්ෂණය වැනි පාරිසරික වගවීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන අඩු පහසුකම් සහිත ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අමාත්‍යාංශයට අදාළ විෂයය පථය යටතේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා භදබිම අධිකාරිය මගින් ව්‍යාපෘති යෝජනා සකස් කර අනුමැතිය ලබා ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

මෙහි දී අමාත්‍යාංශය මගින් කහ, ඉඟුරු, උඳු, මුං, දේශීය අල වගාව සහ දෙමුහුන් පැල වගා ප්‍රවර්ධන ව්‍යාපෘති සහ සත්ත්ව පාලන යටතේ එළු පාලන සහ කුකුල් පාලන ව්‍යාපෘති යෝජනා මෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ද ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා භදබිම අධිකාරිය මගින් ග්‍රාමීය ප්‍රජාව අතර අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලනය ප්‍රවලිත කිරීම, ගොවි සමිති ඒකාබද්ධ කොට ගනිමින් කාබනික පොහොර නිෂ්පාදන ඒකක පිහිටවීම, මධ්‍යම පැල තවාන් 331 ක් පිහිටුවීම, කොත්මලේ ගොවිපල නවීකරණය කිරීම, පල්ලේකැලේ ගොවිපලේ කුකුළු අභිජනන ධාරිතාවය ඉහළ නැංවීම, පල්ලේකැලේ ගොවිපල නවීකරණය කිරීම, සහ දේශීය අල වර්ග, ස්ථිර භෝග, කහ සහ ඉඟුරු වගාව ප්‍රවලිත කිරීම යන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව ඉදිරි වර්ෂවල දී අමාත්‍යාංශයට අනුමත වන ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදාගෙන කෘෂිකර්ම ක්ෂේත්‍රයන්ට අදාළව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් එම නිෂ්පාදන වලින් රටෙහි ජාතික නිෂ්පාදනය වැඩි කිරීමටත් පසුගාමී ප්‍රදේශවල ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමටත් අපේක්ෂිත ය.

.....

ලේකම්,
පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා
සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා
ලේකම්
පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත
සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා
ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
තැපෑල් මූලස්ථාන ගොඩනැගිල්ල
310, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

03. පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		160,162,000	213,137,903	ඒසිඒ-3
-	තැන්පතු		1,431,038	5,246,337	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		7,542,090	4,564,099	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	4,689,087	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**169,135,129**	**227,637,426**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**169,135,129**	**227,637,426**	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)**		216	-	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		**169,134,913**	**227,637,426**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
68,900,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	61,777,682	9,384,274	
39,645,600	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	34,840,329	13,429,883	ඒසිඒ-2(ii)
111,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	94,874,668	100,425,275	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
219,545,600	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**191,492,679**	**123,239,432**	
	මූලධන වියදම්				
11,070,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	7,996,296	1,015,038	
5,870,800	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,861,280	4,234,036	
450,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	201,452,070	46,116,505	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,336,600	හැකියා වර්ධනය	14	819,500	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
468,277,400	**මුළු මූලධන වියදම් (උ)**		**216,129,146**	**51,365,579**	
	තැන්පතු ගෙවීම්		1,635,578	6,146,032	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		5,754,328	18,121,264	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**7,389,906**	**24,267,296**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**415,011,731**	**198,872,307**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(245,876,819)**	**28,765,119**	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(245,876,819)	-	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසිඒ-3
			(245,876,819)	-	

3.3. මූල්‍ය තත්වය පිළිපඳ ප්‍රකාෂය

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	183,732,893	231,175,078
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	11,769,403	13,557,165
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	100,013
මුළු වත්කම්		**195,502,296**	**244,832,256**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(13,834,755)	(12,251,532)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		183,732,893	231,175,078
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	25,604,158	25,808,697
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	100,013
මුළු වගකීම්		**195,502,296**	**244,832,256**

පිටු අංක...7....සිට ...51... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...52.... සිට ...59.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්කරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/02/2022
ඩී.එම්.එල්. බණ්ඩාරනායක
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2022/02/25
වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා
ලේකම්
පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල
310, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2022/2/28
ඒ. ඒ. ධම්මිකා කුරගම
ප්‍රධාන මූල්‍ය නිලධාරි
පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල
310, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

3.4. මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය නැවත ගලපන ලද 2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	4,689,087
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	3,257,673	-
අග්‍රිම ලැබීම්	160,162,000	43,193,044
අත්තිකාරම් අයකර ගැනීම්	3,253,230	1,249,129
තැන්පතු ලැබීම්	1,431,038	1,204,656
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**168,103,941**	**50,335,916**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	96,557,786	16,562,123
සහනාධාර සහ මාරුකිරීම්	494,668	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	50,090,973	25,517,316
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	100,216	13
අත්තිකාරම් ගෙවීම්	4,647,644	1,797,134
තැන්පතු ගෙවීම්	1,635,578	2,132,588
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**153,526,865**	**46,009,174**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**14,577,076**	**4,326,742**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	14,677,076	4,908,953
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**14,677,076**	**4,908,953**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(14,677,076)**	**(4,908,953)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(100,000)**	**(582,211)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(100,000)**	**(582,211)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**100,000**	**682,211**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	**100,000**

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් - පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ගිණුම් පිළියෙල කර ඇත.

*ඇමුණුම **01** බලන්න*

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය -

අදාළ නොවේ. (ආදායම් ශීර්ෂ අංකයක් නොමැත)

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය රු.	අවසන් ප්‍රතිපාදනය රු.		
පුනරාවර්තන	222,750,000	219,645,600	191,492,679	87%
ප්‍රාග්ධන	315,100,000	470,277,400	216,129,146	46%

3.8 මු.රෙ.**208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන රු.	අවසාන ප්‍රතිපාදන රු.		
1	වී හා ධාන්‍ය, ආහාර, එළවළු,..... කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	භෝග වගා ව්‍යාපෘතිය	50,000,000.00	50,000,000.00	49,270,753.20	99.94%
2	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය	120,418.00	120,418.00	120,418.00	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	183,732,893.21	183,732,893.21	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

මගේ අංකය எனது இல. My No. CAM/E/RDAH&EC/2021/09 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 31 දින

ලේකම්
පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

1.6.1.1 තැන්පතු ගිණුම් ශේෂ

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාල රු.25,477,120 ක රැඳවුම් මුදල් 2016 වර්ෂයේ සිට තැන්පතු ගිණුම්වල පැවතියද ගොඩනැගිල්ලේ ඉදිකිරීම් මේ දක්වා අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම 2019 වර්ෂයේ සිට මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශය විෂය පථයෙන් ඉවත් වී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයන් 4 ක සහ ප්‍රාග්ධන වැය විෂයයක එකතුව රු.3,135,000 ක් වූ සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී පැවතුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වැය විෂයයක සහ ප්‍රාග්ධන වැය විෂයයක ශුද්ධ ප්‍රතිපාදන වටිනාකමෙන් සියයට 50 ක් ඉක්මවූ ඉතිරිවීම් පිළිවෙලින් රු.505,332 සහ රු.607,189 ක් විය.

(ඇ) සංවර්ධන සහායන් වැඩසටහන් සඳහා රු.200,000,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අමතරව පරිපූරක මඟින් රු.150,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත් පරිපූරක වටිනාකම ද ඉක්මවා රු.248,547,930 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඈ) වැය විෂයයන් 3 ක රු.63,270,000 ක්වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 මඟින් රු.7,870,000 ක ප්‍රතිපාදන ලබා තිබූ අතර එම වැය විෂයයන් 3 හි 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු.4,443,809 ක් විය. ඉන් එක් වැය විෂයයක මුදල් රෙගුලාසි 66 යටතේ ලබා දී තිබූ රු.400,000 ක ප්‍රතිපාදනයද ඉක්මවා රු.654,546 ක් ඉතිරිවී තිබුණි.

2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සහ වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ වල එකතුව රු.440,464 ක් විය.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

2019 සහ 2020 වර්ෂවල නිකුත් කර තිබූ රු.10,979 ක් වටිනා අස්ථානගත වූ චෙක්පත් 02 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 392 ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම් පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් වූ කාර්යය සාධන වාර්තායට අනුව සුළු ආර්ථික භෝග ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන ඇති කිරීමට සහාය වීම හා අපනයනයට දිරි දීම සහ නිරෝගීමත් ජනතාවක් උදෙසා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණු අතර විටින් විට අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම ද මේ කෙරෙහි සෘජුව බලපා තිබුණි.

(ආ) 2021 අගෝස්තු 31 දිනට ඉදිරිපත් වූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ඉන්දියානු රජයේ ආධාර යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු.200,000,000 ක් වූ සනීපාරක්ෂක ඒකක 3,400 ක් මඩකලපු දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට සැලසුම් කර තිබුණද එම ඉලක්ක ළඟා කර නොතිබුණි.

3.2 බැඳීම් හා බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් යටතේ රු.862,191 ක් වූ බැරකම් දක්වා නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2021 වර්ෂයේදී වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන ඉක්මවා රු.6,799,194 ක බැරකම්වලට බැඳී තිබුණි.

3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ සිදු වී තිබුණු වාහන අනතුරක රු. 78,330 ක් වූ අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අවසන් වාර්තාව සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණු වාහන අනතුරු අවස්ථා 09 කට අදාළ අලාභ වටිනාකම වූ රු.923,118 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාමාර්ග ගෙන තිබූ වාහන අනතුරු අවස්ථා 04 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ සිට වෙනත් රාජ්‍ය ආයතනවලට ස්ථානමාරු වී ගිය නිලධාරීන් විසින් අවස්ථා 07 කදී නිකුත් කිරීම් නියෝග මත රැගෙන ගොස් තිබුණු පරිගණක උපාංග ඇතුළු භාණ්ඩ අදාළ ආයතන වෙත ලැබුණු බවට ලැබීම් නියෝග මගින් තහවුරු කර නොතිබුණි.

(ආ) හිටපු අතිරේක ලේකම් (සංවර්ධන) භාරයේ තිබූ රු.106,990 ක් වටිනා ටැබ් පරිගණක යන්ත්‍රය කෙටි කාලයක් තුලදී අක්‍රිය වීම සම්බන්ධයෙන් මු.රෙ.104 අනුව පරීක්ෂණයක් කිරීමට සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබූ අතර ඒ පිලිබඳ වාර්තාවක් 2021 ජුලි 15 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස දන්වා තිබූ නමුත් අදාළ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් වූ කාර්යය මණ්ඩල විස්තරයට අනුව පුරප්පාඩු සංඛ්‍යාව 15 ක් විය. එහි ඇතුළත් ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ සහ අභ්‍යන්තර විගණක යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩුව පැවතීම අමාත්‍යාංශයේ කාර්යය සාධනය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කර තිබුණි.

P.H. [signature]

එම්. අයි. පුෂ්පා හේමමාලි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	කාර්ය සාධන දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	75% - 89%	50% - 74%
ප්‍රතිපත්ති සම්පාදනය සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම	ප්‍රාග්ධන අරමුදල් **100%** ප්‍රයෝජනයට ගැනීම. **(ඉන්දියානු ආධාර යටතේ සනිපාරකෂක ව්‍යාපෘතියට වෙන් වූ රු. මී. 200 ක මුදල මෙම වසරේ වැය නොකළ බැවින් ඉතිරිකිරීම් වශයෙන් වෙන් කර ඇත.)**		80%	
පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම	1. එළුවන් ඇති කිරීමේ වැඩසටහන කාර්ය සාධන දර්ශක - • ප්‍රතිලාභී පවුල් ගණන • බෙදාදුන් එළුවන් ගණන		80%	
	2. භෝග වගා ප්‍රවර්ධන වැඩසටහන **1**	99%		
	3. භෝග වගා ප්‍රවර්ධන වැඩසටහන **11**		89%	
	කාර්ය සාධන දර්ශක - • ප්‍රතිලාභී පවුල් ගණන • බෙදාදුන් බීජ ප්‍රමාණය (කි. ග්‍රෑ.) • වගා කළ භූමි ප්‍රමාණය (අක්කර) • අපේක්ෂිත අස්වැන්න			

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
01	සියළු තැන්හි පවතින දුගී බව අවසන් කිරීම	**1.1** අඩු ආදායම් ලාභී ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම	<u>සංවර්ධන ව්‍යාපෘති</u> • ගෘහස්ථ කෘෂි භෝග වගා වැඩසටහන්			√
			• සත්ව පාලන ව්‍යාපෘති			√
		1.5 කාලගුණික තත්වයන්ගෙන් ඇතිවන්නාවූ හානිකර බලපෑම් අවම කිරීම	<u>**පරිසර සංරක්ෂණය 1**</u> • පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම			√
			• ජල මූලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණය			√

02	සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	**2.3** 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආදායම වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් මගින් දෙගුණ කිරීම	<u>තාක්ෂණික වැඩසටහන්</u> • පුහුණු වැඩසටහන් • ගුවන් විදුලි වැඩසටහන් • භෝග වගා ක්‍රම හඳුන්වා දීම • උසස් බීජ හා පැල ලබා දීමේ අරමුණින් රජයේ අධීක්ෂණය සහිත ගොවිපොළ සංවර්ධනය			√ √ √ √
		2.4 නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නාවූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම	<u>පරිසර සංරක්ෂණය 2</u> • කාබනික පොහොර නිෂ්පාදනය			√
08	සියල්ල සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික සංවර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය	**8.2** විවිධාංගිකරණය, තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුලින් සහ ඉහල වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම	<u>වෙළඳපොල නිෂ්පාදන</u> • දිස්ත්‍රික් මට්ටමින් බහුවිධ ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

<u>ජයග්‍රහණ</u>

01. රු.මි. **50** ක උඳු සහ මුං භෝග වගා ව්‍යාපෘතිය මගින් අඩු ආදායම් ලාභී පවුල් **8,568** ක් ආවරණය වන පරිදි **99%** ක ප්‍රගතියක් ලබාගැනීම

02. රු.මි. **100** ක උඳු, මුං සහ ඉහුරු භෝග වගා ව්‍යාපෘතිය මගින් අඩු ආදායම් ලාභී පවුල් **15,881** ක් ආවරණය වන පරිදි **89%** ක ප්‍රගතියක් ලබාගැනීම

03. රු.මි. **50** ක ගෘහස්ථ එළු පාලන ව්‍යාපෘතිය මගින් අඩු ආදායම්ලාභී පවුල් **1,356** ක් ආවරණය වන පරිදි **80%** ක ප්‍රගතියක් ලබාගැනීම

<u>අභියෝග</u>

- **2021** වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැවතීම.
- මෙම අමාත්‍යාංශය අලුතින් පිහිටවූ අමාත්‍යාංශයක් වන අතර කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් නොමැති වීම
- සේවයේ නියුතු නිලධාරීන් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	**14**	**10**	**04**
තෘතීයික	**05**	**01**	**04**
ද්විතීයික	**42**	**40**	**02**
ප්‍රාථමික	**22**	**17**	**05**

06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ (සංවර්ධන), පරිපාලන නිලධාරී හා භාෂා පරිවර්තකයින් දෙදෙනෙකුට ඉඩකඩ නොමැති බැවින් කාර්ය සාධනය සඳහා ඇබෑර්තුවල බලපෑම අවම කරවීම සඳහා වැඩබැලීම් යටතේ රාජකාරි කටයුතු කළමනාකරණය කරගෙන යයි.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.)		වැඩසටහනේ ස්වභවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
		ඇමුණුම 02 මගින් දක්වා ඇත				

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ලබාගත් දැනුම භාවිතයට යෙදවීම තුළින් ආයතනයේ රාජකාරිවල ගුණාත්මක භාවය, කාර්යක්ෂමතාවය වැඩි වන අතර, නිලධාරීන් අභිප්‍රේරණය වීම හේතුවෙන් කාර්ය සාධනය වර්ධනය වී ඇත.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **267/2018** අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ටරි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		

3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.4	**2014.05.11** දිනැති අංක **171/2004** දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහන ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.**134(2)** DMA/**1-2019** අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	**2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **40(4)** උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි **134(3)** ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ **1-2019** අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු **04**ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක **01/2017** දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ **07** වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ **13** වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **05/2016** අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. **772** අනුව සිදු කිරීම.	අනුකූලවේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස **06**කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. **103,104,109** හා **110** ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		

9.5	**2016.12.29** දිනැති අංක **2016/30** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **3.1** ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මාසයක කාලයක් ඇතුළත නීරවුල් කර තිබීම	අනුකූලවේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූලවේ		
11.2	මු.රෙ **94(1)** ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූලවේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13	පොදු තැන්පත් ගිණුම්			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.**571** ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූලවේ		
14.2	මු.රෙ **371** ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		

14.3	මු.රෙ. **371** ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූලවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ **176** අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	**2017.09.20** දිනැති MSD චක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	-		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක **05/2008** හා **05/2018(1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	පැවරී ඇති රාජකාරී ස්වභාවය අනුව අනුකූල නොවේ		
18.2	එම චක්‍රලේඛයේ **2.3** ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	-		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	**2018.01.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/2018** ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇතත් **02/2018** චක්‍රලේඛයේ ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන නැත.	**2022** වර්ෂය සඳහා සකස් කිරීම ආරම්භ කර ඇත.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය **12**කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම **01**හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ		**2022** වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
19.4	ඉහත චක්‍රලේඛයේ **6.5** ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

3.5 මූල්‍ය ප්‍රකාශන සටහන්

<u>වාර්තා කිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2021 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනා ගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදයම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් **31** දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

7) <u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.</u>

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව **2020** වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත

06.3 මානව සම්පත් සංවර්ධනය

#	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	**ITMIS**	02	දින 03	නැත	-	දේශීය	**ITMIS** මෘදුකාංගය භාවිතය සම්බන්ධව ගිණුම් අංශයේ නිලධාරීන් දැනුවත් වීම / මෘදුකාංගය හරහා සිදු වන කටයුතු ක්‍රමානුකූලව සිදු වීම.
2	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින පුහුණුව	**04**	දින 02	**32,500.00**	-	දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ නිලධාරීන් දැනුවත් වීම / අංශයේ නිලධාරීන්ගේ දැනුවත්භාවය තුලින් ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදු වීම.
3	පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව	**30**	දින 01	**50,000.00**	-	දේශීය	අමාත්‍යාංශයේ සියළු සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ දැනුම ලබා ගැනීම / පෞද්ගලික ලිපි ගොනු කටයුතු මනාව පවත්වාගෙන යාම.
4	ව්‍යාපෘති යෝජනා සකස් කිරීම	**20**	දින 01	**50,000.00**	-	දේශීය	සංවර්ධන අංශයේ නිලධාරීන් සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම / කාර්යක්ෂමව ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම තුලින් ආයතනයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම.
5	ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාව	**01**	වසර 01	**204,000.00**	-	දේශීය	පාඨමාලාව මෙතෙක් අවසන් වී නොමැත.
6	කාර්යාල කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව	**01**	වසර 01	**90,000.00**	-	දේශීය	කාර්යාල කළමනාකරණය පිළිබඳ ලබාගත් දැනුම තුලින් කාර්යාල කටයුතු මනාව කළමනාකරණය කිරීම.
7	**Ms Office**	**01**	මාස 03	**14,250.00**	-	දේශීය	**Ms Office** භාවිතය පිළිබඳව දැනුම තුලින් ලිපි ලේඛන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම.
8	ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි පාඨමාලාව	**01**	වසර 01	**350,000.00**	-	දේශීය	පාඨමාලාව මෙතෙක් අවසන් වී නොමැත
9	ගබඩා කළමනාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය	**01**	දින 02	**3,750.00**	-	දේශීය	ගබඩා කටයුතු මනාව පාලනය කිරීම / ආයතනය තුල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදු කිරීමට සහය වීම.

36

2021 සංවර්ධන වැඩසටහන් කැමරා ඇසින්...

- භෝග වගා වැඩසටහන් යටතේ බීජ බෙදාදීම













2021 සංවර්ධන වැඩසටහන් කැමරා ඇසින්...

- එළු පාලන ව්‍යාපෘති යටතේ එළුවන් බෙදාදීම








2021 සංවර්ධන වැඩසටහන් කැමරා ඇසින්...

- ශ්‍රී ලංකා හදබිම අධිකාරිය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

පාංශු සංරක්ෂණය




කාබනික පොහොර නිෂ්පාදනය




ජල මූලාශ්‍ර සංරක්ෂණය




තාක්ෂණික පුහුණු වැඩසටහන්




ගොවිපල සංවර්ධනය




බහුවිධ ආදායම් උත්පාදන වැඩසටහන




කුකුල් පැටව් බෙදාදීමේ වැඩසටහන


